# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෂ**

**අංක 2383/25 – 2024 මැයි මස 08 වැනි බදාදා – 2024.05.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 51 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2011/FR/81.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/UDB/4/1/1/146.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 මාර්තු මස 04 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, උඩදුම්බර.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දෙකේ කෝරළේ සුළු කොට්ඨාසයේ, කොබොනිල්ල (891) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කන්දේගම (කොටසක්) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක අ. ග. පි. 504 හා 2016.12.20 දිනැති අවසන් ගමේ පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

1. කැබලි අංක 191 – **කොබෝනිල්ල වත්ත – ප්‍රමාණය: හෙක්. 11.7760**

උතුරට: කැබලි අංක 131, 118 2/3 හා 118 1/3; නැගෙනහිරට: කැබලි අංක 131, 118 2/3, 119, 118 2/3, 118 1/3, 118 2/3, 118 3/3; දකුණට: කැබලි අංක 19, පල්ලේකන්ද (අ. ග. පි. 426); බටහිරට: කන්දෙකුඹුර.

EOG 05 – 0063


1A – G 041900 – 19 (2024/05)


*මෙම අති විශෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 55 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2015/IR/307D.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/3/2/3/ව.ප.ඇ/ව්‍යා.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, ගලේවෙල.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ අංක E 432 I රංවැඩියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගලේවෙල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 346 අතිරේක 77 පත්‍ර 71 හා 2018.02.26 දිනැති අවසන් ගම් පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් දෙකට මායිම්:

01. **කැබලි අංක 1729 – කනාදන *නොහොත්* කනාදන හේන – ප්‍රමාණය: හෙක්. 0.0518**
උතුරට: කැබලි අංක 1730; නැගෙනහිරට: කැබලි අංක 1728 සහ 1727; දකුණට: කැබලි අංක 1723; බටහිරට: කැබලි අංක 1723, 1724, 1734 සහ 1730.

02. **කැබලි අංක 1735 – කනාදන – ප්‍රමාණය: හෙක්. 0.1162**
උතුරට: කැබලි අංක 1737; නැගෙනහිරට: කැබලි අංක 1734, 1732 සහ 1733; දකුණට: කැබලි අංක 1733, 1736 සහ රංවැඩියාව (අ. ග. පි. 337); බටහිරට: කැබලි අංක - රංවැඩියාව (අ. ග. පි. 337).

EOG 05 – 0064

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.